# දියමන්ති ව්‍යාපෘතියට අදාළ ඉතිහාසය විෂය අධ්‍යයන ඉලක්ක.
## (සබරගමු පළාතේ සියලු පාසල් සඳහා)

**පළමුවන අදියර**

**8 ශ්‍රේණිය**

**පළමු වාරය - නර්තනය**

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **01** | **(2.0)** නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.1 ශාරීරික නම්‍යතාවය සඳහා අභ්‍යාස ඉදිරිපත් කරයි. | * නම්‍යතා අභ්‍යාස තෝරාගනී. (සංයුක්ත තැටි වුවද ආධාර කරගත හැක.)<br>• ඒ අනුව නම්‍යතා අභ්‍යාස කරයි.<br>• සංගීත භාණ්ඩ හා බෙර වාදනට අනුව නම්‍යතා අභ්‍යාස කරයි.<br>• අංග, ප්‍රත්‍යංග, උපාංග භාවිතා කරන්නේද යන්න සාකච්ඡා කරයි.<br>• නිවැරදි අංගහාර ඇතිකර ගැනීම සඳහා නම්‍යතා අභ්‍යාස වල නිරත වීම වැදගත් බව සිසුන් සමග සමාලෝචනයක යෙදෙයි. | 02<br>පැ. 01 වි. 20 | ජනවාරි 01 සතිය |
| **02** | **(1)** පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණ කරයි. | 1.1 ස්වාභාවික පරිසරයෙන් හඳුනාගත් සත්ත්ව චර්යා ඇසුරින් නර්තන නිර්මාණය කරයි. | * නර්තන මාධ්‍යයෙන් විවිධ සත්ත්ව චලන නිරූපණය.<br>• ස්වාභාවික පරිසරයේ දක්නට ලැබෙන (අලියා, මොනරා) සත්ත්ව චර්යා සාකච්ඡා කරයි.<br>• සත්ත්ව චර්යා රටා අනුව චලන නිර්මාණය කරයි. | 01<br>විනාඩි 40 | ජනවාරි 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | • සතුන් තුළ ඇති සුවිශේෂ ලක්ෂණ මතුවන පරිදි චලන නිර්මාණය කරයි. (මොණරාගේ බෙල්ල හැසිරවීම, පිල් විදහා නැටීම, අලියාගේ ගමන් විලාශය)<br>• එම චරිත නර්තන මාධ්‍යයෙන් නිරූපණය කරයි.<br>• සංගීත ඛණ්ඩ හා බෙර පද ඇසුරින් සත්ත්ව චරිත නිරූපණය කරයි.<br>• කණ්ඩායම් වශයෙන් සත්ත්ව චරිත නිරූපණය කරයි.<br>• එක් එක් කණ්ඩායම් වල සත්‍යතා හා දුබලතා සාකච්ඡා කරයි. | 02<br>පැ. 01 වි. 20<br><br>01<br>විනාඩි 40<br><br>02<br>පැ. 01 වි. 20 | ජනවාරි 02 සතිය<br><br>ජනවාරි 02 සතිය<br><br>ජනවාරි 03 සතිය |
| **03** | **(2.0)** නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.2 පාද නිවැරදිව හැසිරවීම සඳහා සරඹ ඉදිරිපත් කරයි. | • පා සරඹ 1-9 දක්වා තාල තබමින් කියයි.<br>• 1-5 දක්වා විලම්භ හා මධ්‍ය ලය අනුව නර්තනය කරයි.<br>• ඒ අනුව සිසුන් ක්‍රියාකාරකමේ නිරත වෙයි.<br>• පා සරඹ 7-9 දක්වා තාල තබමින් කියයි.<br>• සරඹ විලම්භ හා මධ්‍යලය අනුව නර්තනය කරයි.<br>• පා සරඹ 7-9 දක්වා තාල තබමින් කියයි. | 01<br>විනාඩි 40 | ජනවාරි 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | • සරඹ විලම්භ හා මධ්‍යලය අනුව නර්තනය කරයි.<br>• හමාර පදය තාල තබමින් කීමට හා නර්තනයට යොමු කරයි.<br>• නර්තනයේදී අංගහාර පවත්වා ගැනීම සඳහා පා සරඹ නර්තනයේ ඇති වැදගත්කම පිළිබඳ සමාලෝචනයේ යෙදෙයි.<br>• ඒකලව හා සාමූහිකව පා සරඹ අභ්‍යාස කරයි. | 02<br>පැ. 01 වි. 20<br>02<br>පැ. 01 වි. 20<br>02<br>පැ. 01 වි. 20 | ජනවාරි 04 සතිය<br>05 සතිය හා පෙබරවාරි 01 සතිය |
| **04** | **(2.0)** නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.3 නර්තනය හා සබැඳි විධි ක්‍රම අනුගමනය කරමින් සරඹ ඉදිරිපත් කරයි. | * සාම්ප්‍රදායික නර්තනයට හස්ත පාද හුරු කරමු.<br>• ගොඩ සරඹ 1-6 දක්වා තාල තබමින් කියයි.<br>• පෙර උගත් සරඹ පද 1-4 දක්වා ලය අනුව නර්තනය කරයි.<br>• ගොඩ සරඹ 5-6 තාල තබමින් කියයි.<br>• එම පද විලම්භ මධ්‍යලය අනුව නර්තනය කර පෙන්වයි.<br>• සිසුන් ඊට අනුකූලව නර්තනය කරයි.<br>• කස්තිරම් තාල තබා කියයි. නර්තනයේ යෙදෙයි.<br>• බෙර වාදනයට අනුව සරඹ පද හා කස්තිරම් නර්තනය කරයි. | 01<br>විනාඩි 40<br>02<br>පැ. 01 වි. 20<br>01<br>විනාඩි 40 | පෙබරවාරි 02 සතිය<br>පෙබරවාරි 02 සතිය<br>පෙබරවාරි 02 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | • නර්තනයේ නිවැරදි අංගහාර පවත්වා ගැනීමට ගොඩ සරඹ නර්තනයේ ඇති වැදගත්කම සාකච්ඡා කරයි. | | |
| **05** | **(2.0)** නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.4 සම්ප්‍රදායික නර්තන ඇසුරින් අලංකාර මාත්‍රා නිර්මාණය කරයි. | • මාත්‍රා 03 කින් තනි තිතට එක් එක් කණ්ඩායම් විසින් අලංකාර මාත්‍රා නිර්මාණය කරයි.<br>• අලංකාර මාත්‍රා බෙර වාදනයට අනුව නර්තනය කරයි.<br>• එක් එක් කණ්ඩායම් විසින් නිර්මාණය කළ අලංකාර මාත්‍රා ඉදිරිපත් කරයි.<br>• එම පද විලම්භ, මධ්‍යලය අනුව නර්තනය කර පෙන්වයි.<br>• එක් එක් කණ්ඩායම් වල නිර්මාණ අගය කරමින් අඩුපාඩු පෙන්වා දෙමින් සමාලෝචනයක යෙදෙයි. | 01<br>විනාඩි 40<br><br>01<br>විනාඩි 40 | පෙබරවාරි 02 සතිය<br><br>පෙබරවාරි 04 සතිය |
| **06** | **(4.0)** ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.1 නිර්දේශිත ගායනාවල සමාජීය හා සංස්කෘතික පසුබිම විස්තර කරයි. | • වන්නම්, සිරසපාද, පතුරු, සවරං කවි වල සංස්කෘතික පසුබිම පිළිබඳ සාකච්ඡා කරයි.<br>• වන්නම්වල කවි ගයමින් සතුටු වෙයි.<br>• සිරස පාද, පතුරු, පතුරු, සවරං කවි භාවිතා කරන අවස්ථා පිළිබඳ සාකච්ඡා කරයි.<br>• එක් එක් ගායනාවල සුවිශේෂතා අගය කරයි.<br>• නියමිත ගායනාවල තොරතුරු රැස්කර සමාලෝචනයේ යෙදෙයි. | 02<br>පැ. 01 වි. 20<br><br>01<br>විනාඩි 40 | පෙබරවාරි 04 සතිය<br><br>පෙබරවාරි 05 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **07** | **(2.0)** නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.5 නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි. | • 2 + 3 තිත් රූපයට තුරඟා වන්නම ගායනා කරයි.<br>• කස්තිරම, සීරු මාැව, අඩව්ව තාල තබමින් කියයි.<br>• බෙර වාදනයට අනුව තුරඟා වන්නම නර්තනය කරයි.<br>• නිවැරදි අංගහාර පවත්වා ගනිමින් කස්තිරම – අඩව්ව දක්වා නර්තනය කරයි. | 02<br>පැ. 01 වි. 20 | මාර්තු 01 සතිය |
| **08** | **(4.0)** ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.2 නියමිත තිත් රූප හා නාද මාලා අනුගමනය කරමින් ගායනය ඉදිරිපත් කරයි. | • ගායනා වලට අදාළ තාල රූප නම් කරයි.<br>• නාද මාලාවට අනුව ගායනා කරයි.<br>• බෙර වාදනයට අනුව තාල තබමින් ගායනා ඉදිරිපත් කරයි.<br>• ඒකීය හඬ තලයක පිහිටා ඒකලව හෝ සාමූහිකව ගායනා කරයි.<br>• නියමිත ගායනාවල තොරතුරු රැස්කර සමාලෝචනයේ යෙදෙයි.<br><br>• ක්‍රීඩා උත්සව<br>• කලාප තරග<br>• ඇගයීම්<br>• පළමු වාර පරීක්ෂණ | 02<br>පැ. 01 වි. 20 | මාර්තු 01/02 සතිය<br><br>මාර්තු 02/03/04 සතිය |

## දෙවන වාරය - නර්තනය

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **01** | **1.0** පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කරයි. | 1.3.2 ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් නර්තන නිර්මාණ කරයි. | * සවරං කවි ගායනා කරයි.<br>● එහි සුවිශේෂ ලක්ෂණ සාකච්ඡා කරයි.<br>● සවරමේ ස්වභාවය හා එය සකස් කර ගන්නා ආකාරය විස්තර කරයි.<br>● සවරං නැටුමට අදාළ සරල මාත්‍රා නිර්මාණය කරයි<br>● සාමූහිකව සවරං නර්තනයක් ඉදිරිපත් කරයි. | 02<br>පැය 01වි. 20<br><br>02<br>පැය 01වි. 20 | අප්‍රේල් 04 සතිය<br><br>අප්‍රේල් 04 / මැයි 01 සතිය |
| **02** | **3.0** සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමින් වාදන උපකරණ ප්‍රදර්ශනය කරයි. | 3.1. පහතරට බෙරය පිළිබඳ තොරතුරු රැස් කරමු. | ● පහතරට බෙරය වාදනය කරමින් බෙරය නිරීක්ෂණය කිරීමට සලස්වයි.<br>● බෙරය සැකසීමට ගන්නා අමුද්‍රව්‍ය පිළිබඳ සාකච්ඡා කරයි.<br>● පහතරට බෙරය ඇඳ කොටස් නම් කරයි.<br>● පහතරට බෙරයෙන් වැයෙන පද කිහිපයක් ලියා දක්වයි. | 02<br>පැය 01වි. 20 | මැයි 01 සතිය |
| **03** | **3.0** සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 3.2. විධික්‍රම අනුගමනය කරමින් බෙර වාදනය කරයි. | * සතර බීජාක්ෂර හඳුන්වා දෙමින් වාදනය කරන ආකාරය පෙන්වයි.<br>● අංගුලියා පදය වාදනය කර සතර බීජාක්ෂර තුළින් බෙර පද වාදනය වන ආකාරය පෙන්වා දෙයි.<br>● සිසුන් වාදනය කිරීමට යොමු කරයි.<br>● සතර බීජාක්ෂර සහිත බෙර පද වාදනය කරයි.<br>● සාමූහිකව හා ඒකලව බෙර පද වාදනය කරයි.<br>● බෙර වාදනයේදී නිවැරදි අක්ෂර වාදනයේ ඇති වැදගත්කම හා එය ධ්වනි ගුණයට බලපාන ආකාරය පිළිබඳ විස්තර කරයි. | 02<br>පැය 01වි. 20<br><br>02<br>පැය 01වි. 20 | මැයි 02 සතිය<br><br>මැයි 03 සතිය<br><br>මැයි 02/03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **04** | **4.0** ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.2 නියමිත තිත් රූප හා නාද මාලා අනුගමනය කරමින් නාදමාලා ඉදිරිපත් කරයි. | • සිරස පාද කවි ගායනා කරයි.<br>• නිවැරදි නාද මාලාවන්ට අනුව ඒකීය හඬතලයක පිහිටා ඒකලව හා සාමූහිකව ගායනා කරයි.<br>• පතුරු කවි ගායනා කරයි.<br>• නිවැරදි නාද මාලාවන්ට අනුව ඒකීය හඬතලයක පිහිටා ඒකලව හා සාමූහිකව ගායනා කරයි. | 01<br>විනාඩි 40<br><br>01<br>විනාඩි 40 | මැයි 03 සතිය<br><br>මැයි 03 සතිය |
| **05** | **2.0** සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ සහ විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.5.2. නිවැරදි අංගහාර උපයෝගී කරගනිමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි. | * වෛරොඩි වන්නමේ තාල රූපය හඳුන්වා දෙමින් ගායනය කරයි.<br>• ගායනය කරන අතරතුර හස්ත චලන ප්‍රදර්ශනය කරයි.<br>• වන්නමට අදාළ පද නර්තනය කරයි.<br>• බෙර වාදනයට අනුව වන්නම නිවැරදිව නර්තනය කරයි.<br>• කස්තිරම, සීරුමාරුව, අඩව්ව තාල තබා නර්තනය කරයි.<br>• නිවැරදි අංගහාර සහිතව බෙර වාදනයට අනුව වෛරොඩි වන්නම නර්තනය කරයි. | 02<br>පැය 01 වි. 20 | මැයි 04/05 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **06** | **5.0** ශ්‍රී ලාංකේය නර්තන සබඳතාවන් හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමයන් රැක ගැනීම පිණිස ක්‍රියා කරයි. | 5.1. ශ්‍රී ලාංකේය නර්තන හා සම්බන්ධ මූලාශ්‍ර හඳුනා ගනියි. | • නර්තන කලාව හා සම්බන්ධ මූලාශ්‍ර නම් කරයි.<br>• රූකම් වර්ග කර දක්වයි.<br>• රූකම් දක්නට ලැබෙන ස්ථාන නම් කරයි.<br>• විවිධ වාදන භාණ්ඩ භාවිත කළ බවට තොරතුරු ළමුන් සමඟ සාකච්ඡා කරයි.<br>• දැනට පවතින රූකම් ආරක්ෂා කිරීම පිළිබඳ යෝජනා ඉදිරිපත් කරයි. | 02<br>පැය 01 වි. 20 | මැයි 05 සතිය |
| **07** | **6.0** රසාඥතා වර්ධනය සඳහා විවිධ කලාංග වල විශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | 6.3. විවිධ ජන වර්ග හා සබැඳි සංස්කෘතික උත්සව පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි. | • විවිධ ආගමික උත්සව පිළිබඳව සිසුන්ගෙන් තොරතුරු විමසයි.<br>• නව රාත්‍රී උත්සව පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.<br>• එහි ආගමික සංස්කෘතික වටිනාකම් ගැන විචාරයට ලක් කරයි.<br>• නර්තන, ගායන, වාදන අංග පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• සංස්කෘතික උත්සවයක් ලෙස නවරාත්‍රී උත්සවය පිළිබඳ කරුණු සමාලෝචනය කරයි. | 02<br>පැය 01 වි. 20 | ජුනි 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **08** | **7.0** විවිධ අත්දැකීම් ඇසුරු කර ගනිමින් කලාංග නිර්මාණය කරයි | 7.3. සරල සැරසිලි අංගයක් නිර්මාණය කරයි. (ගොප් ගෙඩියක් නිර්මාණය කරයි.) | • ගොප් ගෙඩිය සම්බන්ධව සිසුන් සමඟ සාකච්ඡා කරයි.<br>• ගොප් ගෙඩි නිර්මාණ දැකිය හැකි ස්ථාන පිළිබඳ සාකච්ඡා කරයි.<br>• ගොප් ගෙඩියක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය නම් කරයි.<br>• ගොප් ගෙඩියක රූප සටහනක් පෙන්වා ඇඳීමට සැලැස්වීම.<br>• ගොප් ගෙඩිය නිර්මාණය සඳහා අවශ්‍ය සරල උපක්‍රම පෙන්වා දෙයි.<br>• සිසුන් කණ්ඩායම් ලෙස ගොප් ගෙඩි නිර්මාණය කරයි. (ගොප් ගෙඩියට උචිත කැටයම්)<br>• නිර්මාණය කරන ලද ගොප් ගෙඩිය සිසු කණ්ඩායම් වලට ප්‍රදර්ශනය කරයි.<br>• නිර්මාණය කරන ලද ගොප් ගෙඩිය පිළිබඳ අන් අදහස් විමසමින් සමාලෝචනය කරයි. | 02<br>පැය 01 වි. 20<br><br>01<br>විනාඩි 40<br><br>02<br>පැය 01 වි. 20<br><br>01<br>විනාඩි 40 | ජුනි 01/02 සතිය<br><br>ජුනි 02 සතිය<br><br>ජුනි 02/03 සතිය<br><br>ජුනි 03 සතිය |
| **09** | **2.0** නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.6.1.විධි ක්‍රම අනුගමනය කරමින් ප්‍රස්තාර කරයි. | • සුළු මහ (2 + 4) දෙතිතට අදාළ බෙර පදය වාදනය කර කවියක් ගායනය කරයි.<br>• දෙතිතට අදාළ ප්‍රස්තාර වගුව ගොඩ නංවයි.<br>• ප්‍රස්තාරකරණයේ සිද්ධාන්ත පැහැදිලි කොට සිසුන් ප්‍රස්තාරකරණයේ යෙදෙයි.<br>• ප්‍රස්තාර කළ කොටස් ප්‍රායෝගිකව ඉදිරිපත් කරයි.<br><br>• පුනරීක්ෂණ අභ්‍යාස<br>• පළාත්/ සමස්ත ලංකා තරග<br>• ඇගයීම්<br>• ප්‍රායෝගික පරීක්ෂණ<br>• දෙවන වාර පරීක්ෂණ | 01<br>විනාඩි 40 | ජුනි 03 සතිය<br><br>ජුනි 04<br>ජුලි 01, 02, 03, 04 සති |

## තුන්වන වාරය - නර්තනය

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **01** | **1.0** පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කරයි. | 1.2 භාව ප්‍රකාශ වන පරිදි චරිත නිරූපණය කරයි. | • භය නමැති ස්ථායි භාවය පිළිබඳ සිද්ධියක් ඇසුරින් සිසුන් සමඟ සාකච්ඡා කරයි.<br>• රස භාව පිළිබඳ සිසුන් සමඟ අදහස් හුවමාරු කරගනී.<br>• ස්ථායි භාව (භය) පිළිබඳ පින්තූර දෘශ්‍ය පට ප්‍රදර්ශනය කරයි.<br>• කණ්ඩායම් ලෙස එකී අවස්ථා නිරූපණයට ඉඩ සලසයි.<br>• එම නිරූපණවල අඩු පාඩු සකස් කරමින් පාඩම සමාලෝචනය කරයි. | 02<br>පැය 01 වි. 20<br><br>02<br>පැය 01 වි. 20 | අගෝස්තු 04 සතිය<br><br>අගෝස්තු 04 සතිය<br>සැප්තැම්බර් 01 |
| **02** | **4.0** ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.2 නියමිත තිත්රූප හා නාදමාලා අනුගමනය කරමින් ගායනය ඉදිරිපත් කරයි. | • පතුරු/ සවරං කවි නිවැරදි නාද මාලාවට අනුව ගායනා කරයි.<br>• සිසුන් සමඟ ගායනා කරයි.<br>• කණ්ඩායම් වශයෙන් ගායනා කරයි.<br>• ස්ව කැමැත්තෙන් ඉදිරිපත් වන ළමුන්ට අවස්ථාව සලසා දෙයි.<br>• ඒ හා බැඳුණු වෙනත් කවි ගායනා කරයි. | 02<br>පැය 01 වි. 20 | සැප්තැම්බර් 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **03** | **2.0** නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.6.2 විධික්‍රම අනුගමනය කරමින් ප්‍රස්තාර කරයි. | • වෛරොඩි වන්නම ගායනා කරයි.<br>• ප්‍රස්තාරකරණයේ නිවැරදි විධික්‍රම අනුගමනය කරමින් ප්‍රස්තාර කරයි.<br>• සිරස පාද, සවරං, පතුරු කවි ගයයි.<br>• එම කවි ප්‍රස්තාර කරයි.<br>• වෛරොඩි වන්නමේ කස්තිරම්, සීරුමාරු, අඩව් ප්‍රස්තාර කරයි. | 01<br>විනාඩි 40<br><br>01<br>විනාඩි 40 | සැප්තැම්බර් 02 සතිය<br><br>සැප්තැම්බර් 02 සතිය |
| **04** | **5.0** ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | 5.2 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි තොරතුරු ඉදිරිපත් කරයි. | • දෙවොල් මඩු හා පහන් මඩු ශාන්ති කර්ම වල පුරාවෘත කතා පිළිබඳ සාකච්ඡා කරයි.<br>• ශාන්තිකර්ම වලට අදාළ පුද ලබන දෙවිවරු, යකුන් පිළිබඳ සාකච්ඡා කර හඳුනා ගනියි.<br>• දෘශ්‍ය පට නරඹා තොරතුරු රැස් කරයි.<br>• එම කවි ප්‍රස්තාර කරයි.<br>• ශාන්ති කර්මවල ගායන, වාදන, නර්තන හා රංග වස්ත්‍රාභරණ පිළිබඳ තොරතුරු සාකච්ඡා කරයි.<br>• ශාන්තිකර්මවල චාරිත්‍ර විධි රංග භාණ්ඩ හා සැරසිලි තොරතුරු සාකච්ඡා කරයි<br>• ශාන්තිකර්ම පැවැත්වීමේදී සාමුහිකත්වයෙන් කටයුතු කිරීම පිළිබඳව අගයමින් සමාලෝචනය කරයි. | 02<br>පැය 01 වි. 20 | සැප්තැම්බ 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **05** | **5.0** ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | 5.3 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් ප්‍රවර්ධනයට දායක වූවන් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි. | • එස්. පණීභාරත, කේ.එස්. ප්‍රනාන්දු ගලුකාගම හීන් නිලමෙ ශිල්පීන් පිළිබඳ තොරතුරු සාකච්ඡා කරයි.<br>• එක් එක් නර්තන ශිල්පීන්ගේ පින්තූර ප්‍රදර්ශනය කරයි.<br>• ඔවුන්ගේ ජීවන තොරතුරු, නර්තන කලාවට කළ සේවය හා විශේෂ කුසලතා පිළිබඳ තොරතුරු සාකච්ඡා කරයි.<br>• ඒවා සටහන් කරයි.<br>• සියලු තොරතුරු සමාලෝචනය කරමින් ඉදිරිපත් කරයි. | 02<br>පැය 01 වි. 20 | සැප්තැම්බර් 04 සතිය |
| **06** | **6.0** රසාඥතා වර්ධනය සඳහා විවිධ කලාංග වල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | 6.1 මහනුවර දළදා පෙරහැර හා එහි අසිරිය අගයමු. | • මහනුවර දළදා පෙරහැර හා සම්බන්ධ සංයුක්ත තැටි නැරඹීම.<br>• ඒ ඇසුරින් පෙරහැරේ තොරතුරු සාකච්ඡා කරයි.<br>• පැවැත්වීමේ හේතු, ඓතිහාසික පසුබිම, පෙරහැර පැවැත්වීමේ කලා සීමාව, පෙරහැර හා බැඳි චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ සාකච්ඡා කරයි.<br>• නර්තන, ගායන, වාදන, සැරසිලි, රංග වස්ත්‍රාභරණ පිළිබඳ ගවේෂණය කරයි.<br>• ආගමික හා සංස්කෘතික වටිනාකම් අගයමින් සාලෝචනයක යෙදීම | 02<br>පැය 01 වි. 20<br><br>01<br>විනාඩි 40 | සැප්තැම්බර් 04 සතිය<br>ඔක්තෝම්බර් 01<br><br>ඔක්තෝම්බර් 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **07** | **6.0** රසාඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | 6.2 වෙනත් සංස්කෘතික වලට අයත් නර්තන අංගවල අනන්‍යතා ලක්ෂණ ඉදිරිපත් කරයි.<br>(භරත නාට්‍යම්) | • ඉන්දීය නර්තන සම්ප්‍රදායන් පිළිබඳ කතා කරයි. (සංයුක්ත තැටියක් ප්‍රදර්ශනය කරමින්.)<br>• භරත නාට්‍ය සම්ප්‍රදාය පිළිබඳ තොරතුරු සිසුන් සමඟ සාකච්ඡා කරයි.<br>• ආගමික පසුබිම, සංගීත සම්ප්‍රදාය, වාද්‍ය භාණ්ඩ, උගන්වනු ලබන ආයතන, රංග වස්ත්‍රාභරණ, නර්තන අංග හා ප්‍රවර්ධනයට දායක වූවන් පිළිබඳ තොරතුරු අධ්‍යයනයට යොමු කරමින් සාකච්ඡා කරයි.<br>• සමස්ත තොරතුරු අගයමින් සමාලෝචනයේ යෙදෙයි. | 02<br>පැය 01 වි. 20<br><br>02<br>පැය 01 වි. 20 | ඔක්තෝම්බර් 01/2 සතිය<br><br>ඔක්තෝම්බර් 02 සතිය |
| **08** | **7.0** විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් කලාංග නිර්මාණය කරයි. | 7.1 නිර්දේශිත ගීතයක සවන් දී එහි සුවිශේෂතා සාකච්ඡා කරමින් අදහස් ඉදිරිපත් කරයි. | • දී කිරි දී කිරි ගීතය ශ්‍රවණයට සලස්වයි.<br>• ගීතයේ පසුබිම පිළිබඳ සාකච්ඡා කරයි.<br>• රත්න දීප ජන්ම භූමි ගීතය ශ්‍රවණයට සැලැස්වීම.<br>• පද රචනයේදී භාෂාව හසුරවා ඇති අයුරු විස්තර කරයි.<br>• ගීත ගායනය/ පද රචනය/ සංගීතය පිළිබඳ සාකච්ඡා කරයි.<br>• ගීත ගයමින් සතුටු වෙයි. | 01<br>විනාඩි 40<br><br>01<br>විනාඩි 40 | ඔක්තෝම්බර් 03 සතිය<br><br>ඔක්තෝම්බර් 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **09** | **7.0** විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් කලාංග නිර්මාණය කරයි. | 7.2 ගීතයට අනුව නර්තන නිර්මාණය කරයි. | • නිර්දේශිත ගීතවලට නර්තන නිර්මාණය.<br>• දී කිරි දී කිරි ගීතයට සුදුසු චලන යොදා නර්තන නිර්මාණය කරයි.<br>• තාලානුකූල/ ප්‍රකාශනාත්මක චලන යොදා ගනී.<br>• කණ්ඩායම් ලෙස නර්තන නිර්මාණ ඉදිරිපත් කරයි. | 02<br>පැය 01 වි. 20 | ඔක්තෝම්බර් 03/4 සතිය |
| | | | • රත්න දීප ගීතයට සුදුසු චලන යොදා නර්තන නිර්මාණය කරයි.<br>• කණ්ඩායම් ලෙස නර්තන නිර්මාණ ඉදිරිපත් කරයි. | 02<br>පැය 01 වි. 20 | ඔක්තෝම්බර් 04 සතිය |
| | | | • පුනරීක්ෂණ අභ්‍යාස<br>• ප්‍රායෝගික පරීක්ෂණ<br>• ඇගයීම්<br>• විවිධ ප්‍රසංග | | නොවැම්බර් 1, 2, 3, 4 සති |

## දියමන්ති ව්‍යාපෘතියට අදාළ ඉතිහාසය විෂය අධ්‍යයන ඉලක්ක.

## (සබරගමු පළාතේ සියලු පාසල් සඳහා)

**දෙවන අදියර**

**8 ශ්‍රේණිය**

**පළමු වාරය - නර්තනය**

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| **01** | **(2.0)** නර්තනය හා බැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.1 ශාරීරික නම්‍යතාව සඳහා අභ්‍යාස කරයි. | පියවර ක්‍රමය | • ජාතික අධ්‍යාපන ආයතනය මගින් හඳුන්වා දුන් වීඩියෝ පට නැරඹීම. | • සුදුසු සංගීත ඛණ්ඩයකට නම්‍යතා අභ්‍යාස කරවීම. | • ඒකල/ සමූහ වශයෙන් නම්‍යතා අභ්‍යාස ඉදිරිපත් කරන්න. |
| **02** | **(1.0)** පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණය කරයි. | 1.1 සත්ව චරිත නිරූපණය කරයි. | පියවර ක්‍රමය කණ්ඩායම් ක්‍රමය | • සංගීත තැටි හා දෘෂ්‍ය සංයුක්ත තැටි භාවිතා කිරීම. | • කණ්ඩායම් අනුව එක් එක් සත්ව චරිත නිරූපණය කරන්න. | • කොටියා හා සිංහයා යන සත්ව චරිත නිරූපණය කරන්න. |
| **03** | **(2.0)** නර්තනය හා බැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.2 පා සරඹ නර්තනය | කණ්ඩායම් ක්‍රමය අනුකරණ ක්‍රමය | • ජාතික අධ්‍යාපන ආයතනයේ CD පට නැරඹීම. | • නිවැරදි අංගහාර සහිතව 7, 8, 9 පා සරඹ නර්තනය කරන්න. | • තමන් නැමැති පා සරඹ ඒකල/කණ්ඩායම වශයෙන් නිවැරදි අංගහාර සහිතව නර්තනය කරන්න. |
| **04** | **(2.0)** නර්තනය හා බැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.2 ගොඩ සරඹ නර්තනය | පියවර ක්‍රමය | • ජාතික අධ්‍යාපන ආයතනය මගින් හඳුන්වා දුන් CD පට නිරීක්ෂණය කිරීම. | • ලය ප්‍රභේද අනුව ගොඩ සරඹ ප්‍රස්ථාර කරන්න. | • නිවැරදි අංගහාර සහිතව ගොඩසරඹ 2 ක් නර්තනය කරන්න. |

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
| --- | --- | --- | --- | --- | --- | --- |
| **05** | **(2.0)** නර්තනය හා බැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.2 අලංකාර මාත්‍රා නර්තනය | අනුකරණය ක්‍රමය පියවර ක්‍රමය | • රූපවාහිනියේ නර්තන වැඩ සටහන් නැරඹීම ජාතික අධ්‍යාපන ආයතනයේ DVD පට නිරීක්ෂණය කිරීම. | • තනි තිතේ තාල රූපයට අලංකාර මාත්‍රා නිර්මාණය කරන්න. | • ඔබ කැමති තනි තිතේ තාල රූපයකට අලංකාර මාත්‍රා 2 ක් නිර්මාණය කරන්න. |
| **06** | **(4.0)** ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා බැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.1 වන්නම්, පතුරු, සිරස පාද, සවරං කවි ගායනය | පියවර ක්‍රමය | • ගායනා ඇතුළත් හඬපට ශ්‍රවණයට යොමු කිරීම.<br>ජන ගී ආශ්‍රිත පොත් පරිශීලනය කිරීම. | • ජන ගී ආශ්‍රිත සංස්කෘතික පසුබිම පිළිබඳ පොත් පිංචක් නිර්මාණය කරන්න. | • ජන ගී හා බැඳි සංස්කෘතික පසුබිම පිළිබඳ ලිඛිත පරීක්ෂණය.<br>• සම්ප්‍රදායන් තුනෙහි වන්නම්වල සමාන අසමානතා වගු ගත කරන්න. |
| **07** | **(2.0)** නර්තනය හා බැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.5 තුරඟා වන්නම නර්තනය | අනුකරණය ක්‍රමය පියවර ක්‍රමය | • වන්නම් ආශ්‍රිත CD පට නැරඹීම. | • කරන ලද වන්නම් අඩව්ව ප්‍රස්තාර කරන්න. | • තුරඟා වන්නම සාමූහිකව ගයමින් බෙර වාදනයට අනුව නර්තනය කරන්න. |
| **08** | **(4.0)** ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා බැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | වන්නම්, පතුරු, සිරසපාද, සවරං කවි ගායනය | අනුකරණය ක්‍රමය, පියවර ක්‍රමය | • කාන්ති ශිල්පාධිපති මහත්මියගේ CD පටය ශ්‍රවණයට යොමු කිරීම. | • අදාළ කවි ගායනාවලට අදාළ වෙනත් කවි රැස් කරන්න. | • නිවැරදි නාද මාලාවට අනුව තාල තබමින් නම් කරන ලද ගායනය ඉදිරිපත් කරන්න. |

## දෙවන වාරය - නර්තනය

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| **01** | **(1.0)** පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණය කරයි. | 1.3.2සවරං නර්තනය | පියවර ක්‍රමය නිර්මාණකරණය | • අන්තර්ජාලය මගින් සවරං නර්තනය නැරඹීමට යොමු කිරීම. | • සාහිත්‍ය සමිතියට නිර්මාණය කරගත් සවරං නර්තනය ඉදිරිපත් කරන්න. | • සවරං නර්තනය තවදුරටත් නිර්මාණය කර ඉදිරිපත් කරන්න. |
| **02** | **(3.0)** සම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 3.1 පහතරට බෙරය පිළිබඳ කරුණු රැස් කරයි. | සාකච්ඡා ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය | • පහතරට බෙර පිළිබඳ තොරතුරු ඇතුළත් පොත් පරිශීලනය කිරීම. | • පහතරට බෙරය පිළිබඳ සමස්ත තොරතුරු ඇතුළත් පොත් පංචක් නිර්මාණය කරන්න. | • පහතරට බෙරය ඇඳ කොටස් නම් කරන්න. |
| **03** | **(3)** සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය භාණ්ඩ හඳුනා ගනිමින් | 3.2 සතර බීජාක්ෂර හා සරඹ පද වාදනය | අනුකරණය ක්‍රමය<br>පියවර ක්‍රමය | • " උඩරට බෙර වාදන කලාව" පොත පරිශීලනය කිරීම. (කරුණාරත්න බණ්ඩාර මයා) | • සතර බීජාක්ෂර මුල්කරගත් සරඹ පද 3 ක් නිර්මාණය කරන්න. | • නිවැරදිව අක්ෂර පිහිටුවා සතර බීජාක්ෂර සහිත බෙර පද වයන්න. |
| **04** | **(4.0)** ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා බැඳි ගායනා වල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.2 සිරස පාද කවි පතුරු කවි ගායනය | අනුකරණය ක්‍රමය | • CD පට ශ්‍රවණයට සැලැස්වීම. | • වෙනත් සිරසපාද හා පතුරු කවි කීපයක් රැස් කරන්න. | • නිවැරදි නාද මාලාවට අනුව සිරසපාද කවියක් හා පතුරු කවියක් ගායනා කරන්න. |

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| **05** | **(2.0)** නර්තනය හා බැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.5.2 වෛරොඩි වන්නම් නර්තනය | අනුකරණය ක්‍රමය, පියවර ක්‍රමය | • ජාතික අධ්‍යාපන ආයතනය මගින් හඳුන්වා දුන් DVD පට නැරඹීම. | • ගායනය කරමින් වන්නම සම්පූර්ණයෙන් නර්තනය කිරීමට පුහුණු වන්න. | • බෙර වාදනයට අනුව කස්තිරම සීරුමාරුව හා අඩව්ව සහිතව වෛරොඩි වන්නම නර්තනය කරයි. |
| **06** | **(5.0)** ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා බැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම පිණිස ක්‍රියා කරයි. | 5.1 ශ්‍රී ලාංකේය නර්තන කලාව හා සම්බන්ධ මූලාශ්‍රය හඳුනා ගනිමු.(රූකම්, ගල්කැටයම්, ලීකැටයම්,සිතුවම් , මූර්ති) | සාකච්ඡා ක්‍රමය පියවර ක්‍රමය | • අතිරේක කියවීම් පොත පරිශිලනය කිරීම. | • ක්ෂේත්‍ර චාරිකාවක් තුළින් නරඹන ස්ථාන ............ කර තොරතුරු ඇතුළත් පොත් පිංචක් නිර්මාණය කිරීම. | • දෙන ලද ප්‍රශ්නාවලියට පිළිතුරු සැපයීම. |
| **07** | **(6.0)** රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල විශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | 6.3 නවරාත්‍රී උත්සවය | ප්‍රදර්ශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය | • CD තැටි නැරඹීම. අතිරේක පොත පරිශීලනය කිරීම. | • නවරාත්‍රී උත්සවය පිළිබඳ සමස්ත තොරතුරු ඇතුළත් ප්‍රදර්ශන පුවරුවක් සකසන්න. | • නවරාත්‍රී උත්සවය පිළිබඳ කවියක් නිර්මාණය කරන්න. |
| **08** | **(7.0)** විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් කලාංග නිර්මාණ ඉදිරිපත් කරයි. | 7.3 ගොප් ගෙඩියක් නිර්මාණය කිරීම. | සාකච්ඡා ක්‍රමය, ප්‍රායෝගික/ ප්‍රදර්ශන ක්‍රමය | • සාම්ප්‍රදායික සැරසිලි කලාව (ලයනල් බෙන්තරගේ මයා) පරිශීලනය කිරීම. DVD පට | • ගොප් ගෙඩියකට උචිත ගොක් කොළ කැටයම් නිර්මාණය කරන්න. | • ගොප් ගෙඩියක් නිර්මාණය කරන්න. |
| **09** | **(2.0)** නර්තනය හා බැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.6.1 2 + 4 දෙතිතට ප්‍රස්තාර කිරීම. | අනුකරණ ක්‍රමය, පියවර ක්‍රමය | • හෙළ ගී මඟ/ අතිරේක කියවීම් පොත පරිශීලනය කිරීම. | • 2 +4 තාල රූපයට වෙනත් කවියක් ප්‍රස්තාර කරන්න. | • 2 +4 දෙතිතට ඔබ කැමති කවියක් ප්‍රස්තාර කරන්න. |

## තුන්වන වාරය - නර්තනය

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| 01 | **(1.0)** පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණය කරයි. | 1.2 භය නමැති ස්ථායිභාවය. | අනුකරණ ක්‍රමය, ප්‍රදර්ශන ක්‍රමය | • ජාතික අධ්‍යාපන ආයතනය මගින් හඳුන්වා දුන් DVD පටය නැරඹීම. | • "භය" නමැතිස්ථායිභාවය නිරූපණයට අදාළ සිද්ධියක් ගොඩ නගන්න. | • භය නමැති ස්ථායිභාවය උද්දීපනය කරන්න. |
| 02 | **(4.0)** ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.2 පතුරු, සවරං කවි ගායනය | ප්‍රායෝගික ක්‍රමය, පියවර ක්‍රමය | • කාන්ති ශිල්පාධිපති මහත්මියගේ ජන ගී හඬ පටය ශ්‍රවණය කිරීම. | • උගත් කවිවලට අමතරව පතුරු හා සවරං කවි දෙක බැගින් සොයා ගෙන එන්න. | • ඔබ වඩාත් කැමති පතුරු කවියක් හා සවරං කවියක් ඉදිරිපත් කරන්න. |
| 03 | **(2.3)** නර්තනය හා බැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.6.2 2 + 4 දෙතිතේ බෙරපද ප්‍රස්තාර කිරීම. | පියවර ක්‍රමය | • අතිරේක කියවීම් පොත හා හෙළ ගී මඟ කියවීම. | • 2 + 4 දෙතිතට අදාළ රබන් පදයක් සොයා ගෙන එන්න. | • 2 + 4 දෙතිතට අයත් කවියක් ප්‍රස්තාර කරන්න. |
| 04 | **(5.0)** ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | 5.2 දෙවොල් මඩුව හා පහන් මඩුව ශාන්ති කර්ම | ප්‍රදර්ශන ක්‍රමය, පියවර ක්‍රමය | • පහතරට ශාන්තිකර්ම සාහිත්‍ය, සබරගමු නර්තන කලාව ග්‍රන්ථ පරිශීලනය කිරීම. | • දෙවොල් මඩුව හා පහන් මඩුව ශාන්තිකර්ම පිළිබඳ තොරතුරු රැස් කරන්න. | • දෙවොල් මඩුව හා පහන් මඩුව ශාන්තිකර්මයන්හි පූජාවිධි රටාවේ සමාන අසමානතා දක්වන්න. |

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| **05** | **(5.0)** ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | 5.3 එස්.පනීභාරත, කේ.එස්.ප්‍රනාන්දු, හීන් නිලමේ ආදී ශිල්පීන් | ප්‍රදර්ශන ක්‍රමය, සාකච්ඡා ක්‍රමය | • ශ්‍රේණියට අදාළ අමතර කියවීම් පොත පරිශීලනය කිරීම. | • දේශීය නර්තනයේ ප්‍රවර්ධනයට දායක වූවන් පිළිබඳ පිටු පෙරලනයක් නිර්මාණය කරන්න. | • උගත් ශිල්පියෙකු පිළිබඳ ප්‍රදර්ශන පුවරුවක් නිර්මාණය කොට පංති කාමරයේ ප්‍රදර්ශනය කරන්න. |
| **06** | **(6.0)** රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | 6.1 මහනුවර දළදා පෙරහැර | ප්‍රදර්ශන ක්‍රමය | • දළඳා පෙරහැර සම්බන්ධ රූපවාහිනී වැඩ සටහන් හා අන්තර්ජාලය නැරඹීම. | • දළඳා පෙරහැරේ ආගමික හා සංස්කෘතික වටිනාකම පිළිබඳ පුවත්පතකට ලිපියක් සකසන්න. | • පෙරහැරක් නිර්මාණය කරන්න. |
| **07** | **(6.0)** රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංග වල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | 6.2 භරත නාට්‍යම් | සාකච්ඡා ක්‍රමය නිරීක්ෂණ ක්‍රමය | • ආසියානු නර්තන කලාව (මුදියන්සේ දිසානායක මයා) අතිරේක කියවීම් පොත කියවීම. | • භරත නාට්‍යම් පිළිබඳ ප්‍රශ්න 10 ක් සකසන්න. | • ඔබ සකසන ලද ප්‍රශ්න සඳහා පිළිතුරු ලබා දෙන්න. |
| **08** | **(7.0)** විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් කලාංග නිර්මාණය කරයි. | 7.1 දීකිරි දීකිරි/ රත්නදීප ජන්ම භූමි ගීතයට නර්තන නිර්මාණය කිරීම. | ප්‍රදර්ශන ක්‍රමය, පියවර ක්‍රමය | • රූපවාහිනිය, DVD හා CD නැරඹීම | • රැස්වීමට (උදෑසන) සාහිත්‍ය හෝ සමිතියට උචිත ගීතයක් තෝරා ගෙන නර්තන නිර්මාණය කරන්න. | • නිමාවක් සහිතව ප්‍රාසාංගික නර්තන නිර්මාණයක් ඉදිරිපත් කරන්න. |
| **09** | **(7.0)** විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් කලාංග නිර්මාණය කරයි. | 7.2 රත්නදීප ජන්මභූමි ගීතයට නර්තන නිර්මාණය | පියවර ක්‍රමය | • CD පට හා DVD පට නැරඹීම. | • ගීතය කට පාඩම් කරන්න. | • ගැලපෙන චලන උපයෝගී කරගනිමින් නර්තන නිර්මාණය ඉදිරිපත් කරන්න. |